වාර්ෂික වාර්තාව 2022

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්
ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

පටුන

	පිටු අංක
01. හැඳින්වීම	03
02.අධිකාරියේ දැක්ම සහ මෙහෙවර	04
03. අධිකාරියේ අරමුණු සහ කාර්යයන්	05-06
04.ආයතනයේ සංවිධාන ව්‍යුහය සහ කාර්යය මණ්ඩලය	07-11
05. කාර්යය සාධනය	
5.1 නීති හා නීති බලාත්මක කිරීමේ අංශය	12-14
5.2 රැකවරණ අංශය	15-16
5.3 ප්‍රතිපත්ති හා වැඩසටහන් අංශය	17-28
5.4 පාලන හා කළමනාකරණ අංශය	29-30
5.5 මූල්‍ය අංශය	31
06. මූල්‍ය ප්‍රකාශනය හා විගණන වාර්තාව	32-58
07. කාර්යසාධනය වර්ධනයට අදාල කෙටිකාලීන/අර්ධකාලීන සැලසුම්	59-60

01.හැඳින්වීම

විත්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා විධිමත් නෛතික රාමුවක් සහ වැඩපිළිවෙළක් හඳුන්වා දීම මගින් අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සවිබල ගැන්වීම සඳහා පාර්ලිමේන්තුව විසින් ඒකමතිකව සම්මත කරන ලද, 2015 අංක 04 දරන අපරාධයක විත්දිතයන් හා සාක්ෂිකරුවන්ගට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ, අපරාධයක විත්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය පිහිටුවා ඇත. මෙම අධිකාරිය පිහිටුවීමේ මූලික අරමුණ වී ඇත්තේ අපරාධයක විත්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය, ආරක්ෂා කිරීම සහ බලාත්මක කිරීම වේ.ඊට අතිරේකව අපරාධ විත්දිතයන්ගට සිදුවන කායික සහ මානසික හානි වෙනුවෙන් වන්දි ලබා දීම සඳහා අවශ්‍ය ආරක්ෂණ අරමුදල් පවත්වා ගැනීම සේම අපරාධ විත්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට අවශ්‍ය ආරක්ෂාව සැලසීම සහ වෙනත් සහනයන් ලබා දීම මෙන්ම අපරාධයක විත්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහිව සිදුවන වැරදි විමර්ශනය කිරීම හා ඊට අදාල දණ්ඩන නියම කිරීමත් මෙම අධිකාරිය මඟින් ඉටු කරනු ලැබේ.

ඒ අනුව මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි විමර්ශනයන් සිදු කිරීමත්, අදාල පැමිණිලි අවශ්‍ය පරිදි කළමණාකරණ මණ්ඩලය විසින් පත් කරන මූල මණ්ඩලයකට යොමු කොට එකී මූල මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම ද සිදුවේ.එසේම අපරාධ විත්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සඳහා ලැබෙන ඉල්ලීම් අධිකාරියට සම්බන්ධ පොලිස් සහායක සහ ආරක්ෂක කොට්ඨාසයට යොමු කර තර්ජන තක්සේරු සිදු කිරීමෙන් අනතුරුව එකී තර්ජනයේ ස්වභාවය අනුව විත්දිතයාට හා සාක්ෂිකරුට ආරක්ෂාව ලබා දීම සිදු කෙරේ.එමෙන්ම අධිකරණ කටයුතුවලට සහභාගී වීමේ දී විත්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සැලසීමද, ඊට අතිරේකව සමකාලීන ශ්‍රව්‍ය- දෘශ්‍ය තාක්ෂණය මගින් ආරක්ෂිත ස්ථානයන්හි සිට සාක්ෂි ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය ද මෙම අධිකාරිය විසින් සිදුකරනු ලැබේ.

ඒ අනුව 2022 වර්ෂය වන විට විමර්ශනය වෙමින් පැවති පැමිණිලි 379 ට අමතරව 2022 වර්ෂය තුළ අධිකාරිය වෙත මහජනතාවගෙන් හා විවිධ ආයතන වෙතින් පැමිණිලි 259ක් ලැබී ඇති අතර, එම සමස්ත පැමිණිලි අතුරින් ආරක්ෂාව සඳහා ඇති ඉල්ලීම් විමර්ශනය කර 84 දෙනෙකු සඳහා ආරක්ෂාව ලබා දී ඇති අතර, විමර්ශන කටයුතු අවසන් කරන තෙක් 86 දෙනෙකු සඳහා අන්තර් ආරක්ෂාව ලබා දී ඇත.එමෙන්ම අයිතිවාසිකම් හා හිමිකම් කඩවීම් සඳහා ඇති ඉල්ලීම් 80 අතුරින් 56 ප්‍රමාණයක් අවසන් කිරීමට 2022 වර්ෂය තුළ හැකි වී ඇත. කෙසේ වුව ද මෙම පැමිණිලිවලට අදාල සිද්ධිවල ස්වභාවය අනුව හා අධිකරණ ක්‍රියාමාර්ග අවසන් නොවී පැවතීම වැනි සාධක මත මෙම පැමිණිලි අවසන් කිරීමට ගත වන කාලය වෙනස් විය හැකිය.

මීට අමතරව 2022 වර්ෂයේ සමකාලීන ශ්‍රව්‍ය - දෘශ්‍ය සම්බන්ධක උපයෝගී කරගෙන ආරක්ෂිතව සාක්ෂි ලබා ගැනීමේ කටයුතු, විත්දිත බලපෑම් ප්‍රකාශ ගොනු කිරීම මගින් විත්දිතයන් වෙත වන වියදම් පියවා දීම ද සිදුකර ඇත.එසේම විත්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ කටයුතු ද මෙම වර්ෂයේ ක්‍රියාත්මක කර ඇත.

ඒ අනුව 2022 වර්ෂයේ මෙම අධිකාරිය විසින් ලභා කර ගෙන ඇති කාර්යය සාධනය මෙම වාර්තාවේ අන්තර්ගත කොට ඇත.

02.අධිකාරියේ දැක්ම - මෙහෙවර

✓ **<u>දැක්ම</u>**

අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් සුරකින ශ්‍රී ලංකාවක්

✓ **<u>මෙහෙවර</u>**

අපරාධයක විත්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් සුරක්ෂිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම, බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම

03.අධිකාරියේ අරමුණු සහ කාර්යයන්

3.1 අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ අරමුණු

1. අපරාධ වින්දිතයන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් හඳුනා ගැනීම, ප්‍රවර්ධනය කිරීම හා අදාල පැමිණිලි විමර්ශනය කොට එකී නිර්දේශ ක්‍රියාත්මක කිරීම.
2. සාක්ෂිකරුවන්ගේ හිමිකම් හඳුනා ගැනීම හා අදාල පැමිණිලි විමර්ශනය කොට එකී නිර්දේශ ක්‍රියාත්මක කිරීම.
3. අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන්ට අවශ්‍ය සහායයන් සැපයීම හා ආරක්ෂාව ලබාදීමට කටයුතු කිරීම.
4. අපරාධ වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් සංවේදීකරණය කිරීම.
5. අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන්ට එරෙහිව සිදුවන වැරදි සම්බන්ධව නීති මගින් කටයුතු කිරීම.
6. අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන් සඳහා වන්දි ලබාදීමේ අරමුදල පවත්වාගෙන යාම සහ යෙදවීම.
7. අපරාධ අඩු කිරීම හා ඒ සඳහා පර්යේෂණ පැවැත්වීම.
8. අපරාධ සම්බන්ධ දඬුවම් නියම කිරීම සඳහා විකල්පයක් වශයෙන් වින්දිතයන් පුනරුත්ථාපනය කිරීමට අවශ්‍ය පියවර වර්ධනය කිරීම හා ඒ සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

3.2 අපරාධයක විත්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ කාර්යය සහ කර්තව්‍යන්

1. අපරාධයක විත්දිතයන්ගේ අයිතිවාසිකම්, හිමිකම් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
2. සාක්ෂිකරුවන්ගේ හිමිකම් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
3. අපරාධයක විත්දිතයන්ගේ හෝ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හෝ හිමිකම් කඩවීම සම්බන්ධ ලැබෙන පැමිණිලි විභාග කොට ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.
4. අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන්ට අවශ්‍ය ප්‍රතිකාර, හානිපූරණය, ප්‍රතිෂ්ඨාපනය සහ පුනුරුත්ථාපනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.
5. අපරාධයක විත්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට වන්දි ප්‍රදානය කිරීම.
6. මෙම පනත මගින් දක්වා ඇති අපරාධයක විත්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම.
7. අපරාධයක විත්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සැපයීම , අවශ්‍ය ප්‍රතිකාර, පුනුරුත්ථාපන හා උපදේශනය ඇතුලු සහායන් සැපයීම සඳහා සියලුදෙනා දැනුවත් කිරීම.
8. අපරාධයක විත්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් පුනුරුත්ථාපනය කිරීමට අදාළව අනෙකුත් ආයතනවල ප්‍රතිපත්ති හා අනෙකුත් පටිපාටින් සංශෝධන සඳහා නිර්දේශ ලබාදීම.

9. සෑම අධිකාරියකින් හෝ කොමිෂන් සභාවකින් හෝ යම් තැනැත්තකුගේ ඉල්ලීම මත සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධිකරණ පද්ධතිය ඔස්සේ සාක්ෂි ලබාගැනීමේ නිදහස හා සහාය සැපයීම පිළිබඳ තොරතුරු ලබාදීම.

10.යම් අධිකරණයකින් හෝ කොමිෂන් සභාවකින් හෝ වෙනයම් තැනැත්තකුගේ ඉල්ලීම මත සමකාලීන ශ්‍රව්‍ය- දෘශ්‍ය මාධ්‍ය ඔස්සේ සාක්ෂි ලබා ගැනීම සඳහා පිළිගත් ප්‍රතිමානවලට අනුකූලව පහසුකම් සැපයීම.

11.අපරාධයක විත්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට වයස, ස්ත්‍රී පුරුෂභාවය, අබාධිතබව හෝ වෙනත් විශේෂ අවශ්‍යතාවය මත සිදු විය හැකි හානි පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම සහ අපරාධ සිදුවීම අඩු කළ හැකි ක්‍රම සහ ඒ සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීම.

12.දඬුවම් නියම කිරීමට විකල්පයක් වශයෙන් අපරාධ විත්දිතයන් පෙර සිටි තත්ත්වයට ගැනීමේ පියවර වර්ධනය කිරීම හා ඊට අදාල නිර්දේශ ඉදිරිපත් කිරීම.

13.අපරාධ විත්දිතයන් හා සාක්ෂිකරුවන්ට සහාය සැපයීම සඳහා යෝජනා ක්‍රමයන් වැඩි දියුණු කිරීම, යොදා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

14.අපරාධ විත්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ සහායක කොට්ඨාසය පවත්වාගෙන යාම හා නියමු උපදේශ නිකුත් කිරීම

04.ආයතනයේ සංවිධාන ව්‍යුහය සහ කාර්යය මණ්ඩලය

4.1 අධිකාරියෙහි කළමනාකරණ මණ්ඩලය

පනත ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් පත් කළ සාමාජිකයින් :-

1. සභාපති : - ජනාධිපති නීතිඥ සුහද කේ.ගමලත් මහතා
   විශ්‍රාමික සොලිසිටර් ජනරාල්
   නීතිපති දෙපාර්තමේන්තුව



2. වෛද්‍ය අජිත් තෙන්නකෝන් මහතා
   ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරී



3. වෛද්‍ය නීල් ප්‍රනාන්දු මහතා
   විශේෂඥ මනෝ වෛද්‍ය නිලධාරී



4. නීතිඥ සමන් සේනාධීර මහතා



   නීතිඥ විමල් කුමාර මහතා[1]

5. නීතිඥ ඉන්දික පෙරේරා මහතා[2]

නිල බලයෙන් පත්වූ සාමාජිකයින්: -

1. ජනාධිපති නීතිඥ සුසන්ත බාලපටබැදි මහතා
   අතිරේක සොලිසිටර් ජනරාල්
   නීතිපති දෙපාර්තමේන්තුව



2. අජිත් රෝහණ මහතා[3]
   ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති



[1] 2022 සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා
[2] 2022 සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා
[3] 2022 ජනවාරි මස සිට මැයි මස දක්වා

කමල් සිල්වා මහතා[4]

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති

අපරාධ හා රථවාහන පාලන

පොලිස් මූලස්ථානය

3. නිමල් කරුණාසිරි මහතා



කොමසාරිස්

මානව හිමිකම් කොමිෂන් සභාව

4. නීතිඥ පියුමන්ති පීරිස් මහත්මිය



අතිරේක ලේකම් (නීති)

අධිකරණ අමාත්‍යාංශය

5. එන්. එච්. එම්. ඩබ්ලිව්. එන්. හේරත් කුමාරි මහත්මිය



අතිරේක ලේකම් (සංවර්ධන)

කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය

6. එම්. එස්. පී. සූරියප්පෙරුම මහත්මිය



අතිරේක ලේකම් (නීතිය හා සාමය) (වැඩ බලන)

ආරක්ෂක අමාත්‍යාංශය

නිරීක්ෂක (භාණ්ඩාගාර නියෝජිත)

එස්. ඒ. සී. කුලතිලක මහත්මිය[5], අධ්‍යක්ෂ ජනරාල්

පී.එල්. ජේ. ගුණරත්න මහත්මිය[6], අධ්‍යක්ෂ (නීති කටයුතු)

කලමණාකරන විගණන දෙපර්තුමෙන්තුව,

මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සම්පාදන අමාත්‍යාංශය

[4] 2022 ජූනි මස සිට දෙසැම්බර් මස දක්වා

[5] 2022 ජනවාරි මස සිට මාර්තු මස දක්වා

[6] 2022 මාර්තු මස සිට දෙසැම්බර් මස දක්වා

4.2 2022 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්

1. එස්. ඒ. සී. කුලතිලක මහත්මිය[7] - සභාපති
2. පී.එල්. ජේ. ගුණරත්න මහත්මිය[8], අධ්‍යක්ෂ (නීති කටයුතු)
   අධ්‍යක්ෂ ජනරාල්,
   කලමණාකරන විගණන දෙපාර්තුමෙන්තුව,
   මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සම්පාදන අමාත්‍යාංශය

3. පියුමන්ති පීරිස් මිය - සාමාජික
   අතිරේක ලේකම්
   අධිකරණ අමාත්‍යාංශය

4. එම්. එස්. පී. සූරියප්පෙරුම මහත්මිය - සාමාජික
   අතිරේක ලේකම් (නීතිය හා සාමය) (වැඩ බලන),
   ආරක්ෂක අමාත්‍යාංශය
5. නීතිඥ සමන් සේනාධීර මහතා - සාමාජික
   නීතිඥ විමල් කුමාර මහතා[9]
6. සුජීවා පෙරේරා මහත්මිය - නියෝජිත
   ජාතික විගණන කාර්යාලය

7. චම්පා බාලසූරිය - නිරීක්ෂක
   අධිකරණ අමාත්‍යාංශය


[7] 2022 ජනවාරි මස සිට මාර්තු මස දක්වා
[8] 2022 මාර්තු මස සිට දෙසැම්බර් මස දක්වා
[9] 2022 සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා

4.3 අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය කාර්යය මණ්ඩලය

වර්ගය	වැටුප් කේතය	අනුමත කාර්ය මණ්ඩලය	දැනට පවතින කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ මට්ටම				
අධ්‍යක්ෂ ජනරාල්	HM 2-3	1	1	0
අධ්‍යක්ෂ	HM 1-3	6	4	2
සහකාර අධ්‍යක්ෂ	MM 1-3	3	3	0
කළමනාකරණ මණ්ඩල ලේකම්	MM 1-3	1	1	0
තෘතීය මට්ටම				
නීති නිලධාරී	JM 1-1	3	1	2
අභ්‍යන්තර විගණන නිලධාරී	JM 1-1	1	0	1
විමර්ශන නිලධාරී	MA 4	6	5	1
රැකවරණ නිලධාරී	MA 4	10	0	10
සන්නිවේදන නිලධාරී	MA 4	1	0	1
තොරතුරු නිලධාරී	MA 4	1	0	1
භාෂා පරිවර්තක	MA 4	1	1	0
ද්විතීය මට්ටම				
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	MA 1-1	09	6	3
රැකවරණ නිවාස භාරකරු	MA 1-1	01	0	1
ප්‍රාථමික මට්ටම				
රියදුරු	PL 3	6	6	0
කාර්යාල කාර්ය සහායක	PL 1	6	6	0
එකතුව		**56**	**34**	**22**

-වගුව 01-

4.4 අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ -සංවිධාන ව්‍යුහය-



05.කාර්යය සාධනය

5.1 නීති හා නීති බලාත්මක කිරීමේ අංශය


අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ අයිතිවාසිකමක්/හිමිකමක් කඩවීමක් හෝ අත්‍යාසන්න කඩවීමක් පිළිබඳව ලැබුනු යම් පැමිණිල්ලක්/තොරතුරක් මත 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය සහ සහතික කිරීම උදෙසා කරන ලදැයි කියන කඩකිරීම පිළිබඳව විමර්ශනය කිරීම සහ අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම නීති හා නීති බලාත්මක කිරීමේ අංශය මගින් සිදුකරයි.

2022 වසරේ ජනවාරි මස 01 වන දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය වෙත මහජනතාව හා රාජ්‍ය ආයතන වෙතින් යොමු කරන ලද සමස්ත පැමිණිලි ගණන 259[10]ක් වේ.

5.1.1 -2022 වර්ෂයේ පැමිණිලි ලැබීම - භූගෝලීය ප්‍රදේශ අනුව:

පළාත	සංඛ්‍යාව
බස්නාහිර	125
දකුණ	37
මධ්‍යම	21
උතුරු	13
උතුරු මැද	12
වයඹ	16
සබරගමුව	16
නැගෙනහිර	06
ඌව	09
එකතුව	**255**

-වගුව 02-



-ප්‍රස්ථාර 01-

[10] නිර්නාමික පැමිණිලි 01 , ආයතන මගින් යොමුකළ පැමිණිලි 02 සහ විදේශ මගින් යොමුකළ පැමිණිලි 01 සමග 259 වේ.

5.1.2 - පැමිණිලි වර්ගීකරණය:

අධිකාරියට කරනු ලබන පැමිණිලි, 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතෙහි 3,4 වගන්තිවලට අනුව වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම්/හිමිකම් කඩවීම සම්බන්ධයෙන් සහ 8,9 වගන්ති යටතේ වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහිව වන වැරදි ලෙස, පැමිණිලි[11] ස්වභාවය අනුව පහත පරිදි වර්ග කරනු ලැබේ.

i. ආරක්ෂාව සඳහා වන ඉල්ලීම්

ii. අයිතිවාසිකම් හා හිමිකම් කඩවීම්


iii. වැරදි විමර්ශනය

iv. සහාය ඉල්ලීම්

5.1.2.1. 2022 වර්ෂය තුළ එක් එක් අංශ යටතේ පැමිණිලි ලැබීම

ඉල්ලීම් ස්වභාවය	සංඛ්‍යාව
01.ආරක්ෂාව සඳහා වන ඉල්ලීම්	109
02.අයිතිවාසිකම් හා හිමිකම් කඩවීම්	80
03.වැරදි විමර්ශනය	57
04.සහාය ඉල්ලීම්	13
එකතුව	**259**

-වගුව 03-



-ප්‍රස්ථාර 02-

i.අයිතිවාසිකම් හා හිමිකම් කඩවීම්:

2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතෙහි 3,4 වගන්ති යටතේ වන අයිතිවාසිකම් සහ හිමිකම් කඩවීම සම්බන්ධයෙන් සිදුකරනු ලබන ඉල්ලීම් විමර්ශනය කිරීමයි.

2021 වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද පැමිණිලි ගනණ	99
2022 වර්ෂය තුල දැනට ලැබී ඇති පැමිණිලි ගනණ	80
එකතුව	**177**
විමර්ශන අවසන් කරන ලද පැමිණිලි ගනණ	56
තවදුරටත් විමර්ශනය වෙමින් පවතින පැමිණිලි ගනණ	123

-වගුව 04-

[11] සැ.යු.: එක් පැමිණිල්ලක ඉල්ලීම් එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඇතුලත් වේ.

ii.වැරදි විමර්ශනය:

2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතෙහි 8,9 වගන්ති යටතේ දක්වා ඇති වරදවල් සම්බන්ධයෙන් ලැබෙන ඉල්ලීම් විමර්ශනය කිරීමයි.

2021 වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද පැමිණිලි ගනණ	70
2022 වර්ෂය තුල දැනට ලැබී ඇති පැමිණිලි ගනණ	57
එකතුව	**127**
විමර්ශන අවසන් කරන ලද පැමිණිලි ගනණ	29
තවදුරටත් විමර්ශනය වෙමින් පවතින පැමිණිලි ගනණ	98

-වගුව 05-

iii.සහාය ඉල්ලීම්:

අපරාධයක වින්දිතයකු වීම හේතුවෙන් විඳින ලද යම් හානියක් අලාභයක් හෝ පාඩුවක් සඳහා හානිපූරණය සහ ප්‍රතිෂ්ඨාපනය ඇතුලු සුදුසු සහ සාධාරණ සහනයන් ලබා දීමයි.

2021 වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද පැමිණිලි ගනණ	51
2022 වර්ෂය තුල දැනට ලැබී ඇති පැමිණිලි ගනණ	13
එකතුව	**64**
විමර්ශන අවසන් කරන ලද පැමිණිලි ගනණ	6
තවදුරටත් විමර්ශනය වෙමින් පවතින පැමිණිලි ගනණ	58

-වගුව 6-

5.1.3 - සමකාලීන ශ්‍රව්‍ය -දෘශ්‍ය සම්බන්ධක මගින් සාක්ෂි ලබා දීම:

යම් අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට ආරක්ෂාව පිළිබඳ බියක් හෝ වෙනත් සාධාරණ හේතුවක් මත අධිකරණය ඉදිරියේ පෙනී සිටීමට අපහසු අවස්ථාවක දී ශ්‍රී ලංකාවෙන් පිටත හෝ ශ්‍රී ලංකාව තුළ, අධිකරණයෙන් පිටත වෙනත් ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය - දෘශ්‍ය සම්බන්ධක මඟින් සාක්ෂි ලබා ගැනීමට 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 31 වගන්තිය ප්‍රකාරව හිමිකමක් ඇත.ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම අධිකාරියේ නීති අංශය මගින් සිදුකරනු ලබයි.

2022 වර්ෂය තුළ දී පහත සඳහන් නඩු කටයුතු සඳහා නීති අංශය මගින් සමකාලීන ශ්‍රව්‍ය -දෘශ්‍ය සම්බන්ධක ඔස්සේ සාක්ෂි මෙහෙයවීමට අවශ්‍ය සහාය සපයා ඇත. එලෙස සමකාලීන ශ්‍රව්‍ය -දෘශ්‍ය සම්බන්ධක මගින් සාක්ෂි ලබා දුන් නඩු කටයුතු සංඛ්‍යාව - 06 කි.

5.2 රැකවරණ අංශය

2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට ආරක්ෂාව ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම මෙම අංශයෙන් සිදු කරනු ලබයි. ඒ අනුව ආරක්ෂාව ලබා ගැනීම සම්බන්ධයෙන් වන ඉල්ලීම් දෙයාකාරයකින් රැකවරණ අංශය වෙත ලැබේ.

1. **පනතේ 21 වගන්තිය ප්‍රකාරව ආරක්ෂාව ලබා ගැනීම සඳහා අධිකාරිය වෙත යොමු කරනු ලබන පැමිණිලි**
2. **පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව අධිකරණ සහ කොමිෂන් සභා වලින් යොමු කරනු ලබන නියෝග.**

ආරක්ෂාව ලබා ගැනීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් හෝ අධිකරණ හෝ කොමිෂන් සභා නියෝගයක් රැකවරණ අංශය වෙත ලැබූ පසු අදාල අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරු හට තර්ජනයක් පවතින්නේද යන්න සම්බන්ධයෙන් අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය මගින් තර්ජන තක්සේරු වාර්තා කැඳවා ගැනීමට රැකවරණ අංශය විසින් කටයුතු කරනු ලැබේ. අදාල තර්ජන තක්සේරු වාර්තාවන් අනුව අපරාධයක වින්දිතයා හෝ සාක්ෂිකරුට පවතින තර්ජනයේ ස්වභාවය සහ ප්‍රමාණ සලකා බැලීමෙන් අනතුරුව අවශ්‍ය ආරක්ෂාව ලබා දීමට කටයුතු කරයි. තර්ජන තක්සේරු වාර්තා ලැබෙන තෙක් අදාල අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට අන්තර් ආරක්ෂාවක් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

5.2.1- පැමිණිලි සම්බන්ධයෙන් වන ප්‍රගතිය; ආරක්ෂාව සඳහා වන ඉල්ලීම්:

වර්ෂය	පැමිණිලි සංඛ්‍යාව	විමර්ශනය වෙමින් පවතින සහ අන්තර් ආරක්ෂාවක් ලබා දෙමින් පවතින පැමිණිලි	ආරක්ෂාව ලබා දෙමින් පවතින පැමිණිලි	අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව	නීතිපති උපදෙස් සඳහා යොමු කරන ලද පැමිණිලි
පෙර වර්ෂ වලින් ඉදිරියට ගෙන එන ලද පැමිණිලි	159	14	58	86	01
2022	109	72	26	11	-
එකතුව	**268**	**86**	**84**	**97**	**01**

-වගුව 9-

- ආරක්ෂණ අංශය විසින් 2015 අංක 4 දරන පනත යටතේ ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධක ඔස්සේ සාක්ෂි ලබා ගැනීම් 02 ක් 2022 වර්ෂයේදී සිදු කරන ලදි.

- 2022.01.01 දින සිට 2022.12.31 දක්වා අධිකරණ කටයුතු සඳහා සහභාගි වීම වෙනුවෙන් අධිකාරියේ ප්‍රවාහන පහසුකම් යටතේ ආරක්ෂාව ලබා දෙන ලද චින්දිතයන් ගණන දහයක් (10) වන අතර ඔවුන් හට 2022 වර්ෂයේදී ගමන් වාර 41 කදී අවශ්‍ය ආරක්ෂාව ලබා දී ඇත.

5.2.2 අධිකරණ සහ කොමිෂන් සභා නියෝගවලට අදාලව ගෙන ඇති ක්‍රියාමාර්ග:

වර්ෂය	අධිකරණ සහ කොමිෂන් සභා නියෝග ගණන	විමර්ශනය වෙමින් පවතින සහ අන්තර් ආරක්ෂාව ලබා දෙමින් පවතින නියෝග	ආරක්ෂාව ලබා දෙමින් පවතින නියෝග	අවසන් කරන ලද නියෝග
පෙර වර්ෂ වලින් ඉදිරියට ගෙනා නියෝග	63	04	24	35
2022	12	04	06	2
එකතුව	**75**	**08**	**30**	**37**

-වගුව 10-

2015 අංක 4 දරන පනතේ 4(1) වගන්ති ප්‍රකාරව අධිකරණ කටයුතු වලට සහභාගී වීමේදී වැය වන මුදල් ගෙවීම් වෙනුවෙන් 2022 වර්ෂයේදී අධිකරණ නියෝග 03 ක් ලැබී ඇති අතර ඉන් එක් නියෝගයකට අදාල අපරාධයක චින්දිතයන් වන සාක්ෂිකරුවන් දෙදෙනෙකු සඳහා මුදල් ගෙවන ලදි. අනෙක් පැමිණිලි දෙකට අදාලව පියවර ගනිමින් පවති. එමෙන්ම 2019 වරෂයේදී ලැබී ඇති අධිකරණ නියෝගයකට අදාල අපරාධයක චින්දිතයන් වන සාක්ෂිකරුවන් දෙදෙනෙකු හට 2022 වර්ෂය තුළ දී නඩු වාර හත (07) අදාලව අධිකරණ කටයුතු වලට සහභාගී වීම සඳහා මුදල් ගෙවා ඇත.

5.3 ප්‍රතිපත්ති හා වැඩසටහන් අංශය

2015 අංක 4 දරන අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතෙහි (13) වන වගන්තිය ප්‍රකාරව ප්‍රතිපත්ති සහ වැඩසටහන් අංශයේ කාර්යයභාරය ලෙස,අපරාධයක විත්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් පිළිබඳව මහජනයා දැනුවත්කිරීම, පරිවාස සහ සමාජ සේවා සමග සම්බන්ධ රජයේ වෛද්‍ය නිලධාරීන්, රාජ්‍ය සේවකයන්,බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිසියේ ආදී වූ නීතිය බලාත්මක කිරීමේ නිලධාරීන් සංවේදනය කිරීම, අපරාධ සිදුවීම අඩුකළ හැකි ක්‍රම සහ විධි පිළිබඳව පර්යේෂණ පැවැත්වීම, සහ ප්‍රතිපත්ති, නීති, ක්‍රියාමාර්ග සහ ක්‍රියාපටිපාටි අපරාධයක විත්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමට අදාළව සමාලෝචනය කිරීම හා සුදුසු ප්‍රතිපත්ති, නීති සහ ක්‍රියා මාර්ග පිළිගැනීම, සංශෝධනය කිරීම සහ යොදා ගැනීම ආදිය වේ. ඒ අනුව මෙම අංශය ප්‍රතිපත්ති සහ වැඩසටහන් යන කොටස් දෙකෙහිම කාර්යයන් 2022 වර්ෂයේ පහත පරිදි කිරීමට හැකි විය.

5.3.1 - දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම:

<u>වැඩසටහන I</u>

යුක්තියට ප්‍රවේශය ජංගම සේවාව

ගරු අධිකරණ අමාත්‍යතුමාගේ සංකල්පයකට අනුකූලව, අධිකරණ අමාත්‍යාංශය විසින් ‘‘යුක්තියට ප්‍රවේශය’’ නමින් එක්දින රාජ්‍ය සේවය සැපයීම සඳහා වූ ජංගම සේවා වැඩසටහනක් 2022 ජනවාරි 26 දින සිට 30 වන දින දක්වා උතුරු පළාතේ දී පැවැත්විණි. මෙය එම ප්‍රදේශයේ පුරවැසියන්ට සේවා සැපයීම සහ රජයේ නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම යනුවෙන් පිවිසුම් ද්විත්වයකින් සමන්විත විය. ඒ අනුව, අපගේ සේවා සැපයීමටත්, මෙම කාර්යයට මූලික වූ ආයතනය වශයෙන් අප අධිකාරිය සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමත් අපගේ කාර්යය විය. එබැවින්, අප අධිකාරිය විසින් ජනවාරි 27, 28 දෙදිනයන්හිදී, කිළිනොච්චි මාධ්‍ය මහා විද්‍යාලයේ සහ ජනවාරි 29,30 දිනයන්හිදී යාපනය මාධ්‍ය මහා විද්‍යාලයේ, අලංකාර කුටියක් නිර්මාණය කෙරිණි. ජංගම සේවයට සමගාමීව, 2022 ජනවාරි මස 26 දින සිට 30 වන දින දක්වා දිනයන්හිදී උතුරු පළාතේ දිස්ත්‍රික ලේකම් කාර්යාලවල විවිධ ස්ථානවල දී දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විණි. මේ හරහා අධිකාරිය පිහිටුවීමට මූලික වූ පනත සහ අධිකාරියේ කාර්යභාරය සම්බන්ධයෙන් රජයේ නිලධාරීන් 960 දැනුවත් කිරීමට සමත් විය. එමෙන්ම, එම ප්‍රදේශවල, විත්දිතයන්ගේ/සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් උල්ලංඝණය වීම් සම්බන්ධව සේවය ලබා ගැනීමට පැමිණි ජනතාවගේ පැමිණිලි භාර ගැනිණි.

යුක්තියට ප්‍රවේශය ජංගම සේවාව පැවති දිනය සහ ස්ථාන පිළිවෙලින් 2022 ජනවාරි 26 සිට 30 දක්වා **කිලිනොච්චි** මාධ්‍ය මහා විද්‍යාලයේ **සහ** යාපනය මාධ්‍ය මහා විද්‍යාලයේදී වන අතර එහි අවස්ථා කිහිපයක් පහත ඡායාරූප මගින් දැක්වේ.











වැඩසටහන II


උතුරු මැද පළාතේ පොලිස් ස්ථානවල අපරාධ අංශයේ ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීමේ සහ සංවේදී කිරීමේ වැඩසටහන

අරමුණ- "යුක්තිය පසිදලීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ වැදගත්කම - පොලිස් නිලධාරින්ගේ කාර්යභාරය" යන තේමාව මුල්කර ගනිමින් උතුරු මැද පළාතේ පොලිස් ස්ථානයන්හි සේවයේ නියතු අපරාධ අංශයේ පොලිස් ස්ථානාධිපතිවරුන් (72) දැනුවත් සහ සංවේදී කිරීමේ වැඩසටහනක් 2022 මාර්තු මස 3 වන සහ 4 වන දිනයන්හිදී එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහනේ අනුග්‍රාහකත්වයෙන් පොලොන්නරුව සුදු අරලිය හෝටලයේදී සාර්ථකව නිම කරන ලදී. මෙම වැඩසටහන සමාරම්භක උලෙළකින් සහ විෂය පථයට අදාල ක්ෂේත්‍ර එනම් අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන නීතිය, පොලිස් ආරක්ෂක කොට්ඨාසය, අධිකාරියේ කාර්යයන් සහ කර්තවයන්, රාජ්‍යය නිලධාරින්ගේ වගකීම, වින්දිතයන් සහ සක්ෂිකරුවන්ගේ සමාජීය සහ මානසික වටපිටාව, අධිකරණ වෛද්‍ය නිලධාරීතුමාගේ සහ පොලිස් ආරක්ෂක කොට්ටාශයේ ක්‍රියාපිළිවෙත, ප්‍රාදේශිය පොලිසි සහ අධිකාරිය සමග සම්බන්ධතාවය, දැනට ලබාගත් අත්දැකීම් යනාදී තාක්ෂණික සැසියන්ගෙන් සමන්විත විය. මෙම තාක්ෂණික සැසියන් සඳහා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුලු කළමණාකරන මන්ඩලයේ විද්වතුන් විසින් දේශන පවත්වන ලදී.

දිනය/ස්ථානය - 2022. 03. 03 හා 04 / සුදු අරලිය හෝටලය, පොළොන්නරුව

සහභාගීත්වය - උතුරු මැද පළාතේ සියළුම පොලිස් ස්ථානයන්හි අපරාධ අංශයේ ස්ථානාධිපතිවරුන්.

උතුරු මැද පළාතේ පොලිස් ස්ථානවල අපරාධ අංශයේ ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීමේ සහ සංවේදී කිරීමේ වැඩසටහනේ විශේෂ අවස්ථා කිහිපයක් පහතින් දැක්වේ.









වැඩසටහන III

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල්හි සමග කළ වැඩමුළුව

Transparency International-Sri Lanka ආයතනය සමග එක්ව 2022 මාර්තු 27 දින ඒකල-ජාඇල ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන නියෝජිතයින් (30) දැනුවත් කිරීමේ වැඩ සටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහන අධිකාරිය හා එම ආයතනය සමග ඇතිකරගත් ගිවිසුම් ප්‍රකාරව සිදු කරන ලද අතර අධ්‍යක්ෂ-ප්‍රතිපත්ති සහ වැඩසටහන් විසින් අධිකාරිය හා එහි සේවාවන් පිළිබඳව දේශනයක් පවත්වන ලදී.

දිනය/ස්ථානය - 2022 මාර්තු 27 / ඒකල-ජාඇල ප්‍රදේශයේ

සහභාගීත්වය - ඒකල-ජාඇල ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන නියෝජිතයින් 30 දෙකෙකු සහභාගී විය.

එම වැඩසටහනේ අවස්ථා කිහිපයක් පහත ඡායාරූප මගින් දැක්වේ.




වැඩසටහන IV

කලුතර පොලිස් විද්‍යාලය සමග ආධුනික පොලිස් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම

කලුතර පොලිස් විද්‍යාලයේ විසිර යාමට නියමිත වූ ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන් 218 සඳහා එක් වැඩසටහනක්ද සහ ආධුනික පොලිස් කොස්තාපල්වරු 800 සඳහා වැඩසටහන් දෙකක්ද 2022 ජුලි 26 සහ 27 කලුතර පොලිස් පුහුණු විද්‍යාලලෙයේදී සිදු කරන ලදී. මෙම වැඩසටහන් සඳහා අධිකාරියේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ-නීති බලාත්මක කිරීම සම්පත් දායකත්වයෙන් සිදුවිය.

දිනය/ස්ථානය - 2022. 07. 26 හා 27 / කලුතර පොලිස් විද්‍යාලීය ශාලාවේදී

සහභාගීත්වය - ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන් 218 ආධුනික පොලිස් කොස්තාපල්වරු 800

ආධුනික පොලිස් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහනේ විශේෂ අවස්ථා කිහිපයක ඡායාරූප පහතින් දැක්වේ.









<u>වැඩසටහන V</u>

මහාධිකරණ විනිසුරුවරුන් සඳහා වැඩසටහනක් පැවැත්වීම

විනිසුරුවරුන් පුහුණු කිරීමේ ආයතනය සමග එක්ව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මූල්‍ය දායකත්වයෙන් මහාධිකරණ විනිසුරුවරුන් 40 දෙනකු සඳහා පනත ක්‍රියාත්මක කිරීමේ සුවිශේෂී වැඩමුළුවක් (Judges Colloquium) 2022 අගෝස්තු මස 6 සහ 7 දින වාද්දුව බිලුවෝටෙර් හොටලයේදී පැවැත්විනි. මේ සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු යසන්ත කෝදාගොඩ, අධිකාරියේ සභාපතිතුමා, කළමනාකරණ මන්ඩලයේ සාමාජිකයින් සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ප්‍රතිපත්ති විශේෂඥ හා රාජ්‍යය අංශ ප්‍රධානී චන්ද්‍රිකා කරුණාරත්න මහත්මිය විසින් දේශන පවත්වන ලදී.

දිනය/ස්ථානය - 2022. 08.06 හා 07 / බිලූ වෝටර් හෝටලය - වාද්දුව

සහභාගීත්වය - මහාධිකරණ විනිසුරුවරුන් 40 දෙනක්

මහාධිකරණ විනිසුරුවරුන් සඳහා කළ වැඩසටහනේ විශේෂ අවස්ථා කිහිපයක ඡායාරූප පහතින් දැක්වේ.







වැඩසටහන VI

මහේස්ත්‍රාත්/දිස්ත්‍රික් අධිකරණ වල විනිසුරුවරුන් සඳහා වැඩසටහනක් පැවැත්වීම

විනිසුරුවරුන් පුහුණු කිරීමේ ආයතනය සමග එක්ව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මූල්‍ය සහ තාක්ෂණික දායකත්වයෙන් මහේස්ත්‍රාත්/දිස්ත්‍රික් අධිකරණ වල විනිසුරුවරුන් 40 දෙනකු සඳහා පනත ක්‍රියාත්මක කිරීමේ සුවිශේෂී වැඩමුළුවක් 2022 අගෝස්තු මස 20 සහ 21 දින වස්කඩුව සිට්‍රස් හොටලයේදී පැවැත්විනි. මේ සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු යසන්ත කෝදාගොඩ, අධිකාරියේ සභාපතිතුමා, කළමනාකරණ මන්ඩලයේ සාමාජිකයින් සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ප්‍රතිපත්ති විශේෂඥ හා රාජ්‍යය අංශ ප්‍රධානී චන්ද්‍රිකා කරුණාරත්න මහත්මිය විසින් දේශන පවත්වන ලදී.

දිනය/ස්ථානය - 2022. 08. 20 හා 21/ සිට්‍රස් හෝටලය - වස්කඩුව

සහභාගීත්වය - මහේස්ත්‍රාත්/දිස්ත්‍රික් අධිකරණ වල විනිසුරුවරුන් 40 දෙනක්

මහේස්ත්‍රාත්/දිස්ත්‍රික් අධිකරණ වල විනිසුරුවරුන් සඳහා කළ වැඩසටහනේ විශේෂ අවස්ථා කිහිපයක ඡායාරූප පහතින් දැක්වේ.






වැඩසටහන VII

පොලිස් ආරක්ෂක සහ සහායක කොට්ඨාශයේ නවක නිලධාරීන් සඳහා තාක්ෂණික වැඩමුලුවක් පැවැත්වීම

අධිකාරියට අනුයුක්ත පොලිස් ආරක්ෂක සහ සහායක කොට්ඨාශයේ නවක පොලිස් නිලධාරීන් 25 දෙනෙකු සඳහා 2022 අගෝස්තු මස 26 වන දින බත්තරමුල්ල වෝටර්ස් ඒජ් (Water's Edge) හෝටලයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ අනුග්‍රාහකත්වයෙන් තාක්ෂණික පුහුණු වැඩමුලුවක් පවත්වන ලදී. මෙහිදී විශේෂයෙන්ම වින්දිතයන් හට සහායදීමේ සහ ආරක්ෂා කිරීමේ පනත ක්‍රියත්මක කිරීමට අමතරව ඔවුන් දැනට මුහුන දෙන ගැටලු සම්බන්ධව සාකච්ඡා විය. මේ සඳහා අධිකාරියේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ-නීති බලාත්මක සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ප්‍රතිපත්ති විශේෂඥ හා රාජ්‍යය අංශ ප්‍රධානී චන්ද්‍රිකා කරුණාරත්න මහත්මිය විසින් දේශන පවත්වන ලදී.

දිනය/ස්ථානය - 2022.08.26 / බත්තරමුල්ල වෝටර්ස් ඒජ් (Water's Edge) හෝටලයේදී

සහභාගීත්වය - අපරාධයක වින්දිතයන් හ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පොලිස් ආරක්ෂක කොට්ඨාශයේ නිලධාරීන්







වැඩසටහන VIII

මධ්‍යම පළාතේ මහාධිකරණ විනිසුරුවරුන් සඳහා වැඩසටහනක් පැවැත්වීම

විනිසුරුවරුන් පුහුණු කිරීමේ ආයතනය සමග එක්ව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මුල්‍ය දායකත්වයෙන් මහාධිකරණ විනිසුරුවරුන් 37 දෙනකු සඳහා වින්දිතයන් හට සහායදීමේ සහ ආරක්ෂා කිරීමේ පනත ක්‍රියාත්මක කිරීමේ සුවිශේෂී වැඩමුළුවක් 2022 ඔක්තෝම්බර් මස 15 සහ 16 දින දඹුල්ල ජෙට්වින් හොටලයේදී පැවැත්විය. මේ සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු යසන්ත කෝදාගොඩ, අධිකාරියේ සභාපතිතුමා, කළමනාකරණ මන්ඩලයේ සාමාජිකයින් සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ප්‍රතිපත්ති විශේෂඥ හා රාජ්‍යය අංශ ප්‍රධානී චන්ද්‍රිකා කරුණාරත්න මහත්මිය විසින් දේශන පවත්වන ලදී.

දිනය/ස්ථානය - 2022.10.15හා 16

සහභාගීත්වය - මහාධිකරණ විනිසුරුවරුන් 37 දෙනක්

මධ්‍යම පළාතේ මහාධිකරණ විනිසුරුවරුන් සඳහා කළ වැඩසටහනේ විශේෂ අවස්ථා කිහිපයක ඡායාරූප පහතින් දැක්වේ.









<u>වැඩසටහන IX</u>

උතුරු සහ නැගෙනහිර පළාත්වල මහේස්ත්‍රාත්/දිස්ත්‍රික් අධිකරණ වල විනිසුරුවරුන් සඳහා වැඩසටහනක් පැවැත්වීම

විනිසුරුවරුන් පුහුණු කිරීමේ ආයතනය සමග එක්ව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මූල්‍ය සහ තාක්ෂණික දායකත්වයෙන් ප්‍රධාන වශයෙන් උතුරු සහ නැගෙනහිර මහේස්ත්‍රාත්/දිස්ත්‍රික් අධිකරණ වල විනිසුරුවරුන් 54 දෙනකු සඳහා පනත ක්‍රියාත්මක කිරීමේ සුවිශේෂී වැඩමුළුවක් 2022 දෙසැම්බර් මස 3 සහ 4 දින හබරණ විලේජ් හෝටලයේදී පැවැත්විණි. මේ සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු යසන්ත කෝදාගොඩ, අධිකාරියේ සභාපතිතුමා, කළමනාකරණ මන්ඩලයේ සාමාජිකයින් සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ප්‍රතිපත්ති විශේෂඥ හා රාජ්‍යය අංශ ප්‍රධානී චන්ද්‍රිකා කරුණාරත්න මහත්මිය විසින් දේශන පවත්වන ලදී.

දිනය/ස්ථානය - 2022.12.03 හා 04 හබරණ විලේජ් හෝටලය - හබරණ

සහභාගීත්වය - උතුරු සහ නැගෙනහිර මහේස්ත්‍රාත්/දිස්ත්‍රික් අධිකරණ වල විනිසුරුවරුන් 54 දෙනක්

උතුරු සහ නැගෙනහිර පළාත්වල මහේස්ත්‍රාත්/දිස්ත්‍රික් අධිකරණ වල විනිසුරුවරුන් සඳහා කළ වැඩසටහනේ විශේෂ අවස්ථා කිහිපයක ඡායාරූප පහතින් දැක්වේ.









වැඩසටහන X

චින්දිතයන් පිළිබඳ සමීක්ෂනය පදනම් කරගනිමින් කලුතර දිස්ත්‍රික්කය තුල දැනුවත් කිරීමේ නියමු ව්‍යාපෘතියක් දියත් කිරීම

මෙහිදී ප්‍රධාන වශයෙන්ම දිස්ත්‍රික්කයේ තොරාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවයේ නියතු ග්‍රාම නිළධාරී මහත්ම මහත්මීන් සහ ක්ශේත්‍ර නිළධාරී මහත්ම මහත්මීන් දැනුවත් කිරීම තුලින් ඔවුන් විසින් ග්‍රාම සේවා වසම් වල අපරාධයන්ට ගොදුරු වූ පවුල් හදුනාගෙන සමීක් ෂනය දියක් කිරීම සිදු කිරීමට බලාපොරොත්තු වේ.

ප්‍රථම අදියර වශයෙන් කලුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියතු ග්‍රාම නිළධාරී මහත්ම මහත්මීන් 60 දෙනෙක් සඳහා එක් වැඩටහනකුත් සහ ක්ශේත්‍ර නිළධාරී මහත්ම මහත්මීන් 60 දෙනෙක් සඳහා තවත් වැඩටහනකුත් වශයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් දෙසැම්බර් මස 12 වන දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී සිදු කරන ලදී.

දිනය/ස්ථානය - 2022.12.09 කලුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී

සහභාගීත්වය - ග්‍රාම නිළධාරී මහත්ම මහත්මීන් 60 දෙනක් සහ ක්ෂේත්‍ර නිළධාරී මහත්ම මහත්මීන් 60 දෙනෙක්

එම වැඩසටහනේ අවස්ථා කිහිපයක් පහත ඡායාරූප මගින් දැක්වේ.








5.3.2 - අධිකාරියේ වාර්ෂික වාර්තා සකස් කිරීම සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම:

අධිකාරියේ 2020 වාර්ෂික වාර්තා පිලියෙළ කර අධිකරණ අමාංශය හරහා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර එහි පිටපත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම කරන ලදී.

5.3.3- වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීම පිළිබඳව පර්යේෂණ සිදු කිරීම හා මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම:

වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීම පිළිබඳව පර්යේෂණ සිදු කිරීම සඳහා මධ්‍යස්ථානය 2021 වර්ෂයේදී ස්ථාපිත කරන ලද අතර ඒ සඳහා පොත්පත් මිලදී ගැනීම සිදු කරන ලදී. අධිකාරියේ නිලධාරින් මෙම පොත්පත් පරිශීලනය කරමින් පවතී.

5.3.4- වෙනත්:

a. වින්දිතයන්හට සහය සපයන අන්තර්ජාතික (Victim Support Asia) ආයතනය හා එක්වී ඔවුන්ගේ තරගකාරී වැඩසටහන සමග සම්බන්ධ වී අධිකාරියෙන් සහය අපේක්ෂා කරන ලද වින්දිතයන් දෙදෙනකු හට US$1000 (Rs 330,000.00 පමණ) බැගින් එම වින්දිතයන්ගේ වින්දිතභාවය නිසා වූ හානිය අවම කරගැනීමට ආධාර ලබා දෙන ලදී.
b. සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර ආයතනය (IOM) සමග සම්බන්ධ වී අධිකාරියේ නිලධාරීන් (21 දෙනෙකු) සඳහා තැනැත්තන් වෙළඳාම පිළිබඳව දින දෙකක වැඩමුලුවක් කොළඹ MovenPick හෝටලයේදී පවත්වන ලදී.
c. ආරක්ෂක අමාත්‍යාංශයේ තැනැත්තන් වෙළඳාමට එරෙහි වූවන්ගේ සංසදයේ (Anti-Human Trafficking Task Force) සාමාජිකයෙක් ලෙස අධිකාරිය කටයුතු කිරීම හා ඒ සඳහා වරින්වර අවශ්‍ය වාර්ථා සකස් කර ඉදිරිපත් කිරීම.
d. විදේශ කටයුතු අමාත්‍යාංශයේ විශ්ව ආවර්තිතා සමාලෝචනය (Universal Periodic Review) 4 වන චක්‍රය සඳහා අවශ්‍ය වාර්ථා සකස් කර ඉදිරිපත් කිරීම.
e. අධිකරණ අමාත්‍යාංශයේ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය සහ කාන්තා හිංසන පිළිබඳව වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම සඳහා අධිකාරියේ සහයෝගීත්වය ලබා දීම.
f. ආරක්ෂිත නිවස්න සඳහා මාර්ගොපදේශන සකස් කිරීම
g. වින්දිතයන් හට සහාය දීම සඳහා වන අරමුදලේ ප්‍රතිපාදන ලබාදීම සඳහා මාර්ගොපදේශන මාලාවක් සකස් කිරීම.

5.4 පාලන හා කළමනාකරණ අංශය

අධිකාරියේ කාර්යාලීය ක්‍රියාවලීන්ට අවශ්‍ය සහය නිරන්තරයෙන් සපයමින්, ආයතනයේ සේවාලාභීන්ට විශිෂ්ට සේවාවක් සැපයීම පාලන හා කලමනාකරණ අංශයේ මූලික කාර්යභාරයයි. අධිකාරියට අවශ්‍ය කරනා මානව, භෞතික සම්පත් සැපයීම සහ පරිපාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ද, මෙම අංශයෙන් සිදු කෙරේ.

5.4.1- දේශීය / විදේශීය පුහුණු:

- ✓ අදාළ කාලය තුළ විදේශ පුහුණු වැඩසටහන් කිසිවක් සඳහා සහභාගී නොවිණි.
- ✓ දේශීය පුහුණු වැඩසටහන් එකක් පවත්වන ලද අතර ඒ පිළිබඳ විස්තර පහතද පරිදි වේ.

දිනය	පුහුණු වැඩසටහන	කාලය	සහභාගී වූ පිරිස	පිරිවැය රු.	සම්පත්දායකත්වය
2022.06.15	Zoom තාක්ෂණය භාවිතය පිළිබඳව (Zoom link සෑදීම, Zoom Link Update කිරීම, Zoom මාධ්‍ය ඔස්සේ පවත්වනු ලබන සාකච්ඡාවක් පවිගත කිරීම.	පැය 06 යි	**10 යි.** (සභකාර අධ්‍යක්ෂ නීති 01 කළමනාකරණ මණ්ඩල ලේකම් 01, නීති නිලධාරීන් 01, විමර්ශන නිලධරීන් 05, කළමනාකරණ සහකාර 02)	18,000.00	තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය (බස්නාහිර පළාත)
2022.12.23	ඵලදායීතාවය තුලින් ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ ආයතනික අරමුණු ලභා කර ගැනීම.	එක් දින වැඩමුළුවකි.	**සේවකයින් 31 යි.**	117,648.00	ජාතික ඵලදායිතා මධ්‍යස්ථානය

-වගුව 11-

5.4.2- ප්‍රසම්පාදන (ප්‍රසම්පාදන සැලැස්මට අනුව) :

- ✓ රැකවරණ නිවස සඳහා අවශ්‍ය ගෘහ උපකරණ මිළ දී ගැනීම.

අනු අංක	දිනය	භාණ්ඩ පිළිබඳ විස්තර	පිරිවැය	මිළදී ගත් ආයතනය
01	2022.03.22	රැකවරණ නිවස සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ - ඇඳන් 06, ටවල් රැක් 06, කෑම මේස පුටු 06, කෑම මේස 01	317,844.00	රාජ්‍ය දැව සංස්ථාව
02	2022.03.22	රැකවරණ නිවස සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ - කුඩා ලියන මේස 04, ලී / බෝඩ් අල්මාරි 03, ඇඳි සහිත කුෂන් පුටු 06	246,810.00	රිවර්ඩ් පිරිස් ආයතනය (ආර්පිකෝ)
03	2022.03.30	රැකවරණ නිවස සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ - මෙට්ට 06, රූපවාහිනී යන්ත්‍ර 01, Rice Cocoer 01, Gas Cocker 01	140,623.00	සිංගර් ආයතනය
04	2022.12.29	රැකවරණ නිවසේ ග්‍රිල් සවි කිරීම.	387,200.00	S.S. ATTIC ආයතනය
05	2022.12.30	රැකවරණ නිවස සඳහා අවශ්‍ය මුළුතැන්ගේ/ගෘහ උපකරණ මිලදී ගැනීම.	82,101.00	විවිධ ආයතනවලින් මිලදී ගන්නා ලදී.

-වගුව 12-

5.4.3- මානව සම්පත් කළමනාරණය:

අධිකාරියේ කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම හා නව තනතුරු ඇතිකිරීම සම්බන්ධව පහත පරිදි කටයුතු කර ඇත.

- ✓ රැකවරණ නිවාස භාරකරු නමින් නව තනතුරක් අනුමත කර ගන්නා ලදී.
- ✓ පුරප්පාඩුව පවතින අධ්‍යක්ෂ රැකවරණ, රැකවරණ නිලධාරී, නීති නිලධාරී තනතුරු බඳවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත තොරතුරු ඉදිරිපත් කරන ලදී.
- ✓ 2023.12.23 දින අධිකාරියේ සමස්ත කාර්යය මණ්ඩලය සඳහා ඵලදායීතා සංවර්ධන වැඩසටහනක් (එක්දින වැඩමුලුවක්) මාලබේ තලාහේන අධ්‍යාපන සමූපකාර ආයතනයේ දී පැවැත්වීම.

කළමනාකරණ මණ්ඩල සහ අනෙකුත් රැස්වීම්

කළමනාකරණ මණ්ඩල රැස්වීම් - 09

විශේෂ කළමනාකරණ මණ්ඩල රැස්වීම් - 02

විගණන හා කළමනාකරණ රැස්වීම් - 03

ගරු ඇමති තුමන් සහ ලේකම් තුමන්/තුමිය සමග රැස්වීම් - 03

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ නිලධාරීන්ගේ රැස්වීම් - 06

5.5 මූල්‍ය අංශය

අධිකාරියේ මූල්‍ය අංශය, ආයතනයට අවශ්‍ය අරමුදල් ලබා ගැනීම, අරමුදල් කළමනාකරණය කිරීම සහ විවිධ වත්කම් සඳහා අරමුදල් වියදම් සැලසුම් කිරීමේ වගකීම දරයි. මූල්‍ය අංශය මඟින් ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස සියලු ක්‍රියාකාරකම්වලට සහාය වීම සඳහා වැදගත් වන කාර්යක්ෂම මූල්‍ය කළමනාකරණය සහ මූල්‍ය පාලනය තහවුරු කරයි.

5.5.1 – 2022/12/31 දිනට අදාල ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සාරංශ වාර්තාව:

විස්තරය	2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි)	සංශෝධිත ප්‍රතිපාදන 2022 (රු.මි)	නිදහස් කරන ලද ප්‍රතිපාදන (රු.මි)	2022.12.31 දිනට වියදම (රු.මි)	2022.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය නිදහස් කරන ලද ප්‍රතිපාදන වලින් (%)	2022.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් (%)
පුනරාවර්තන වියදම	49.00	49.47	43.98	42.87	97 %	87 %
ප්‍රාග්ධන වියදම	8.00	7.75	2.98	2.54	85 %	33 %
එකතුව	**57.00**	**57.22**	**46.96**	**45.41**	**97%**	**79%**

- වගුව 13-

5.5.2 - අධිකාරියේ ආරක්ෂණ අරමුදල:

2015 අංක 04 දරන අපරාධයක චින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 29 වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ ආරක්ෂණ අරමුදල ස්ථාපිත කර ඇත. 2022 දෙසැම්බර් 31 දිනට එම අරමුදලට අදාල තොරතුරු පහත පරිදි වේ.

2022.01.01 දිනට ඉදිරියට ගෙන එන ලද ශේෂය	රු. 12,782,994.00
2022 වර්ෂය තුළ අරමුදලට එකතුවීම්	රු. 3,491,856.00
2022.12.31 දිනට ශේෂය	රු 16,274,850.00

-වගුව 14-


06. මූලාශ්‍ර ප්‍රකාශනය හා විගණන වාර්තාව

FINAL ACCOUNTS 2022

THE NATIONAL AUTHORITY FOR THE PROTECTION OF VICTIMS OF CRIME AND WITNESSES

MINISTRY OF JUSTCIE, PRISON AFFAIRS AND CONSTITUTIONAL REFORMS

1ST FLOOR, 428/11A, DENZIL KOBBEKADUWA MAWATHA, BATTARAMULLA



NOTES TO THE FINANCIAL STATEMENTS FOR THE YEAR ENDED 31.12.2022

ACCOUNTING POLICIES

1. CORPORATE INFORMATION

1.1. Domicile and Legal Form

National Authority for the Protection of Victims of Crime & Witnesses established by Assistance to and Protection of Victims of Crime & Witnesses Act No. 04 of the year 2015 by the parliament of Democratic Socialist Republic of Sri Lanka and expanding its area of services further, under the Ministry of Justice. The head office is located at No. 428/11 A, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka.

1.2 Principal Activities and Nature of Operations

With the aspect of achieving the objects of the Act, the duties and the functions of the Authority are enlisted under Section 13 of Assistance to and Protection of Victims of Crime & Witnesses Act No. 04 of 2015.

1.3 The Number of Employees

The number of employees at the end of the year 2022 was 34.

2 BASIS OF PREPARATION

2.1 Statement of Compliance.

The financial statements of National Authority for the Protection of Victims of Crime & Witnesses comprise the Statement of Financial Position, Statement of Financial Performance, Statement of Cash Flow, Statement of Changes in Equity and Notes to the Financial Statements and other explanatory information. These statements are prepared in accordance with the Sri Lanka Public Sector Accounting Standards (SLPSAs) laid down by the Institute of Chartered Accountants of Sri Lanka (ICASL).

2.2. Basis of Measurement

The financial Statements have been prepared on the historical cost Basis.

No adjustments have been made for inflationary factors in the financial statements

2.2 Functional and presentation Currency.

These financial Statements are presented in Sri Lankan Rupees, which is the National Authority for the Protection of Victims of Crime & Witnesses functional currency.

3 SIGNIFICANT ACCOUNTING POLICIES

These accounting policies set out bellow have been applied consistently to all periods presented in these financial statements.

3.1. Property, Plant and Equipment

The cost of Property, Plant and Equipment is the cost of acquisition or construction together with any expenses incurred in bringing the asset to its working condition for its intended use. Subsequent to the initial recognition as an asset at cost, revalued assets are carried at revalued amount less any subsequent deprecation thereon. All other Property, Plant and Equipment are stated at cost less accumulated depreciation. Where an item of Property, plant and equipments comprises major components having different useful lives, they are accounted for as separate item of Property, plant and equipments.

The asset's residual values, useful lives and methods of depreciation are reviewed, and adjusted if appropriate, at each financial year end.

Property, Plant and Equipment- Received as Grant

Property, Plant and Equipment acquired under any grant are capitalized at cost.

Property, Plant and Equipment other than freehold land are stated at cost less accumulated depreciation. Free hold land is stated at cost.

Depreciation is charged on all Property, Plant and Equipment other than freehold land to write off the cost over the estimated useful lives.

Depreciation has been provided for the year on pro-rata basis.

Property, Plant and Equipment are depreciated on straight line method as mentioned below, further, that the all Property, Plant and Equipment have been accounted at cost method as prescribe in the **SLPSAS 7 - Property, Plant & Equipment**.

1.	Building	4%
2.	Motor Vehicle	12.5%
3.	Computer & Accessories	25%
4.	Furniture & Office Equipment	10%
5.	Office Premises	4%
6.	Soft Ware	25%
7.	Others	10%.

An item of Property, Plant and Equipment is derecognized upon disposal or when no future economic benefit is expected from its use or disposal. Any gain or loss arising on de-recognition of the asset (Calculated as the difference between the net disposal proceeds and the carrying amount of the asset) is included in the income statement in the year the asset is derecognized.
Expenditure incurred on repairs or maintenance of Property, Plant and Equipment in order to restore or maintain future economic benefit expected from originally assessed standard of performance is recognized as an expense when incurred.

3.2 Inventories

The inventories used during the financial year had been charged to the income & expenditure statement at cost.

Balance stock has been valued at cost, selling price or net realizable value whichever is lower.

3.3. Cash and Cash equivalents

Cash and cash equivalents comprise cash in hand and held at bank.

3.4. Cash flow Statement

Cash flow Statement has been prepared using the indirect method.

3.5. Liabilities and Provisions

Liabilities are recognized in the balance sheet when there is a present obligation as a result of past events, the settlement of which is expected to result in an outflow of resources embodying economic benefits. Obligations payable at the demand of the creditors or within one year of the balance sheet date are treated as current liabilities in the Balance sheet.

Provision is recognized if, as a result of a past event, the National Authority for the Protection of Victims & Crime Witnesses has a present legal or constructive obligation that can be estimated reliably, and it is probable that an outflow of economic benefit will be required to settle the obligation.

3.6. Taxation

Tax expenses reported in the financial statement and computed in accordance with the provision of the Inland Revenue Act, No. 24 of 2017 and its amendments thereto.

3.7. Employee Benefits

I. Define Contribution Plan.

Obligation to define contribution plan are recognized as an expense in the income statement as incurred. National Authority for the Protection of Victims of Crime & Witnesses contributes 12% and 3% of gross emoluments of employees to Provident Fund and Trust Fund respectively.

II. Define Benefit Plan

